ශිෂ්‍යත්ව විභාගය

# 4 ශ්‍රේණියේ පරිසර ප්‍රශ්න



සංජීව මාපා බණ්ඩාර

(01) එක ඉත්තක කුඩා පත්‍ර රාශියක් ඇති ශාකයකි,

1. පැපොල් 2. සියඹලා 3. වැල් දොඩම් 4. රෝස

(02) ආහාර රසවත් කිරීමට යොදා ගන්නා ශාක පත්‍රයකි,

1. ගම්මිරිස් 2. සුදුළූණු 3. කරපිංචා 4. එනසාල්

(03) බීජ ඉවත් කර ආහාරයට ගන්නා එළවළුවකි,

1. දඹල 2. පතෝල 3. වැටකොළු 4. වම්බටු

(04) 

රූපයේ දැක්වෙන සත්ත්වයා වන්නේ,

1. කැරපොත්තා 2. හූනා
3. මකුළුවා 4. කෝඳුරුවා

(05) සපා කන සතෙකි,

1. ගවයා 2. කුකුළා 3. දඬු ලේනා 4. මදුරුවා

(06) 

මෙම පාද අයත් සත්ත්වයා වන්නේ,

1. කොකා 2. තාරාවා
3. කැරලා 4. බල්ලා

(07) තනිව හැසිරෙන සතෙකි,

1. ගිරවා 2. කුඹියා 3. පිළිහුඩුවා 4. මුවා

(08) යකඩ හා ලී යොදාගෙන සාදා ඇති උපකරණයකි,

1. ළමා මේසය 2. අල්මාරිය 3. කොස්ස 4. පැන්සල

(09) අමුවෙන් ආහාරයට නොගන්නා දෙයකි,

1. තක්කාලි 2. කැරට් 3. පිපිඤ්ඤා 4. මඤ්ඤොක්කා

(10) පෝෂ්‍යදායි බීම වර්ගයක් නොවේ,

1. කෝපි 2. බාර්ලි 3. රණවරා 4. කෘත්‍රිම බීම

(11) මැල්ලුමක් ලෙස ද , ව්‍යංජනයක් ලෙස ද, සලාදයක් ලෙස ද සාදාගත හැකි පලා වර්ගයකි,

1. මුකුනුවැන්න 2. ගොටුකොළ 3. අගුන කොළ 4. සාරණ

(12) ජාතික ගීයේ නිර්මාතෘවරයා වන්නේ,

1. පණ්ඩිත් අමරදේව මහතා 2. ආනන්ද සමරකෝන් මහතා
3. දයානන්ද ගුණවර්ධන මහතා 4. මාර්ටින් වික්‍රමසිංහ මහතා

(13) 

මෙම රූපයේ දැක්වෙන ආගමික සංකේතය අයත් ආගම වන්නේ,

1. බෞද්ධ 2. හින්දු 3. කතෝලික 4. ඉස්ලාම්

(14) වයින්,කේක්, පුඩින් ආදී කෑම බීම ආහාරයට ගන්නේ,

1. ද්‍රවිඩ ජාතිකයින් ය. 2. මුස්ලිම් ජාතිකයින් ය. 3. බර්ගර් ජාතිකයින් ය. 4. සිංහල ජාතිකයින් ය

(15) ජලය උරාගන්නා ද්‍රව්‍යයකි,
1. ගල් කැටය 2. පුළුන් කැබැල්ල 3. කාසිය 4. විනාකිරි

(16) ගොඩබිම ගමන් කරන වාහනයක් නොවේ,
1. පාපැදි 2. කරත්තය 3. ලොරි 4. සබ්මැරීනය

(17) 
මෙම සංඥාවලින් කියැවෙන්නේ,
1. බස් නැවතුම්පොළ 2. උසාවිය ඉදිරියෙනි,
3. නළා ශබ්ද කිරීම තහනම් 4. වැලමිට වංගුව ඉදිරියෙනි.

(18) විසිතුරු ශාකයක් නොවේ,
1. ගොටුකොළ 2. ඇන්තූරියම් 3. ක්‍රෝටන් 4. බිගෝනියා

(19) අතීතයේ දී තොරතුරු හුවමාරු කරගත් ක්‍රමයකි,
1. දුරකථනය මගින් 2. රූපවාහිනිය මගින් 3. හූ කීම මගින් 4. පරිගණකය මගින්

(20) පරාගනය සඳහා උදව් වන සතෙකි,
1. මී මැස්සා 2. කපුටා 3. ගිරවා 4. පූසා

(21) ආහාර පිසීමේ වැරදි පුරුද්දකි,
1. පලා වර්ග සිහින්ව කැපීම 2. අමුවෙන් ගත හැකි ආහාර අමුවෙන් ගැනීම
3. පලා වර්ග අධික ලෙස නොමැලවීම 4. මැටි භාජනවල ඇඹුල් සහිත ආහාර පිසීම

(22) 
මෙම විකල්ප බඳුන සෑදීමට යොදාගෙන ඇති ද්‍රව්‍ය වන්නේ,
1. පොල් ලෙලි 2. වැහිපීලි
3. ඉවත දැමූ බූලියක් 4. කිරි හට්ටියක්

(23) ජාතික කොඩිය ඔසවන විට සිටිය යුතු ඉරියව්වක් නොවන්නේ,
1. ශරීරය ඍජුව තබා ගැනීම 2. හිස කෙළින් තබා ගැනීම
3. විලුඹ දෙක ළඟ කර පා මඳක් ඈත් කර 4. පහසුවෙන් සිටීම

(24) කැරොල් ගායනා පවත්වන්නේ,
1. කතෝලික බැතිමතුන් 2. ඉස්ලාම් බැතිමතුන් 3. හින්දු බැතිමතුන් 4. ආදී වාසීන්

(25) ස්වාභාවිකව සිදුවන අනතුරකි,
1. වාහන දෙකක් එකට හැප්පීම 2. ගංවතුර ඇති වීම 3. පිහියට අත කැපීම 4. ගසකින් වැටීම

(26) ශරීරය වර්ධනය කරන ආහාරයකි,
1. මස් 2. බත් 3. කොස් 4. කැරට්

(27) ජලය අපිරිසිදු වන ක්‍රමයක් නොවන්නේ,
1. වැව්වල සතුන් නෑවීම
2. ජලය උණු කිරීම
3. කර්මාන්තශාලාවලින් බැහැර කරන අපද්‍රව්‍ය ජලාශවලට මුසු කිරීම
4. කොළ රොඩු ළිඳට වැටීම

(28) කාලසටහනට අනුව ධාවනය වෙයි.
1. ත්‍රීරෝද රථ 2. දුම්රිය 3. මෝටර් රථ 4. පා පැදි

(29) පොළොවට ඉහළින් මුල් පිහිටා ඇති ශාකයකි,

1. වැටකෙයා  2. රෝස  3. බෙලි  4. නෙල්ලි

(30) ආහාරයට ගන්නා අල වර්ගයකි,

1. වැටකොළු  2. බතල  3. රටකජු  4. වට්ටක්කා

(31) පෙති 5 ක් ඇති මලකි,

1. නා  2. අටපෙතියා  3. වද  4. රත්මල්

(32) කඳේ ගෙඩි හටගන්නා ශාකයකි,

1. බිලිං  2. දොඩම්  3. අන්නාසි  4. රඹුටන්

(33) නිවස ආශ්‍රිතව ගැවසෙන සතෙකි,

1. ඌරා  2. හූනා  3. කුකුළා  4. ගවයා

(34) මහාමාරිය රෝගය බෝ වන්නේ,

1. මීයාගේ මුත්‍රා මඟින් ය.  2. මදුරුවා මඟින් ය.

3. අපිරිසිදු ජලය මඟින් ය.  4. මීයාගේ ඇඟේ සිටින මැක්කෙකු මඟින් ය.

(35) 

රූපයේ දැක්වෙන කුරුල්ලා වන්නේ,

1. පැණි කුරුල්ලා  2. ගේ කුරුල්ලා

3. බට්ටිච්චා  4. පොල්කිච්චා

(36) අපට ජලය ලැබෙන ප්‍රධාන මාර්ගය වන්නේ,

1. වර්ෂාව  2. ළිඳ  3. වැව්  4. දිය ඇළි

(37) ක්ලාන්ත වූ රෝගියකු සඳහා ලබාදිය යුතු ප්‍රථමාධාරය වන්නේ,

1. උණුසුම් යමක් පානය කිරීමට දීම ය.  2. කෑමට යමක් ලබා දීම ය.

3. රෝහල වෙත ඉක්මනින් ගෙන යාම ය.  4. ඇඳුම ලිහිල් කර පවන් සැලීම ය.

(38) ඉන්ධන යොදා ගමන් කරන වාහනයකි,

1. පාරුව  2. ඔරුව  3. පහුර  4. බෝට්ටු

(39) පොදු වාහනවල ඇති අංක තහඩුවේ වර්ණය වන්නේ,

1. රතු  2. සුදු  3. කළු  4. නිල්

(40) ඇණයක් ගැසීමට හා ගැලවීමට යොදා ගන්නේ,

1. පංචරය  2. ස්ටේප්ලරය  3. අඬුව  4. අඬුමිට්ටිය

(41) අතීතයේ දී සෙක්කුව කැරකැවීමට යොදාගත් සතා වන්නේ,

1. අලියා  2. අශ්වයා  3. ගවයා  4. බූරුවා

(42) කුණු රොඩු එකතු කිරීම සඳහා යොදාගන්නා උපකරණය වන්නේ,

1. මුල්ලුව  2. රේක්කය  3. කතුර  4. උදැල්ල

(43) රෝද එකක් ඇත්තේ,

1. කරත්තයේ ය. 2. විල්බැරෝවේ ය 3. ඩක්කුවේ ය 4. ත්‍රීරෝද රථයේ ය

(44) කහ පැහැයක් ගන්නා මල් වර්ගයකි,

1. රණවරා 2. ඇන්තූරියම් 3. කටරොඩු 4. බිනර

(45) ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වන්නේ,

1. පාන් 2. කොස් 3. බත් 4. මස්

(46) ජාතික කොඩියේ සතර බ්‍රහ්ම විවරණය සංකේතවත් වන්නේ,

1. පලා පෙතිවලින් ය. 2. නෙළුම් මලින් ය. 3. ධර්ම චක්‍රයෙනි 4. බෝපත් සතරෙනි

(47) 'වනක්කම්' යනුවෙන් ආචාර කරන්නේ,

1. බර්ගර් ජාතිකයින් ය. 2. මුස්ලිම් ජාතිකයින් ය.
3. ආදී වාසීන් ය. 4. ද්‍රවිඩ ජාතිකයින් ය.

(48) ජලයට දැමූ විට ජලය දම් පැහැයක් ගන්නේ,

1. කොන්ඩිස් 2. පෙට්‍රල් 3. ඩීසල් 4. විනාකිරි

(49) පිරිසිදු ජලය සම්බන්ධ වැරදි ප්‍රකාශයකි,

1. පාටක් ඇත. 2. සුවඳක් නැත. 3. රසක් නැත 4. හැඩයක් ඇත.

(50) වැඩි පිරිසකට එකවර ගමන් කළ හැකි වාහනයකි,

1. පාපැදිය 2. යතුරු පැදිය 3. වෑන් රථය 4. දුම්රිය

(51) ගෙවත්තට කෘමි සතුන් පැමිණීම වළක්වා ගැනීමට වවන ශාකයකි,

1. පොල්පලා 2. දහස්පෙතියා 3. උඳුපියලිය 4. වැට මාර

(52) කෙළින්ම බීජ පාත්තිවල සිටුවන බෝගයකි,

1. මෑ 2. තක්කාලි 3. පොල් 4. දොඩම්

(53) වැස්සට පෙර දැකිය හැකි ලක්ෂණයකි,

1. කුණු රොඩු ගසා ගෙන ගොස් තිබීම 2. කානුවල වතුර එකතු වී තිබීම
3. ගස්වැල් ප්‍රාණවත් වී තිබීම 4. පරිසරය අඳුරු වී වලාකුළු කළු පැහැ ගැනීම

(54) ඇස මුල් කරගෙන පමණක් තොරතුරු ලැබෙන ක්‍රමයකි,

1. දුරකථනය 2. ශබ්ද විකාශන යන්ත්‍රය 3. පුවත්පත 4. රූපවාහිනිය

(55) නිශ්ශබ්දතාවය දැඩි ලෙස රැක ගත යුතු ස්ථානය,

1. වෙළෙඳපොළ 2. පුස්තකලාය 3. ක්‍රීඩාගාරය 4. සිනමාහල

(56) වෙස් මුහුණු සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයකි,

1. පිළිමතලාව 2. වෙන්නප්පුව 3. අම්බලන්තොට 4. අම්බලන්ගොඩ

(57) පාසලේ අතීත තොරතුරු දැනගත හැකි ලිඛිත මූලාශ්‍රයක් නොවන්නේ,

1. ලොග් සටහන් 2. සමරු පලක 3. සිසු නාම ලේඛන 4. ගමේ වැඩිහිටියන්

(58) ගස්වැල් නොමැති තැන්වල වැසි වෙලාවට සිදුවන හානියකි.

1. පස වැස්සෙන් සෝදා ගෙන යාම 2. පස් සේදීයාම අඩුකම 3. සරු පස් එතැනට ගලා යෑම.

(59) වනාන්තරවල පස ආරක්ෂා වීමට බලපාන ප්‍රධාන හේතුව වන්නේ,

1. ගල්තලාව තිබීම. 2. වන වැස්ම තිබීම. 3. ගල්වැටි දමා තිබීම.

(60) 

රූපයේ දැක්වෙන ඓතිහාසික ස්ථානය වන්නේ,

1. දළදා මාලිගාව 2. කැලණි විහාරය
3. ගල් විහාරය 4. සීගිරිය

(61) ශාක පත්‍ර පොඩි කර එහි සුවඳින් හඳුනාගත හැකි ශාකයකි,

1. පුවක් 2. දෙල් 3. කරපිංචා 4. පතොක්

(62) අතු නොබෙදුණු ශාකයකි,

1. පොල් 2. රඹුටන් 3. මුරුංගා 4. දෙහි

(63) කටු සහිත කොළ ඇති ශාකයකි,

1. කොහිල 2. උක් 3. කොස් 4. වැල් දොඩම්

(64) මිනිසාට හානි නොකරන සතෙකි,

1. මදුරුවා 2. වේයා 3. මැස්සා 4. සමනලයා

(65) අලංකාරය පිණිස ඇති කරන සතෙකි,

1. ඌරා 2. කුකුළා 3. සුරතල් මසුන් 4. ගවයා

(66) වටිනා ඖෂධයක් ලබා දේ.

1. මී මැස්සා 2. මොනරා 3. බැටළුවා 4. කුඹියා

(67) පෞද්ගලික භාණ්ඩයක් නොවේ,

1. අත් ලේන්සුව 2. පිඟාන 3. යට ඇඳුම 4. කතුර

(68) වඩුවාට අවශ්‍ය උපකරණයකි,

1. වරක්කලය 2. ලඹය 3. මට්ටම් ලීය 4. මනිස් ලෑල්ල

(69) සත්ත්වමය ආහාරයකි,

1. සෝයා 2. ඉන්නල 3. වෙඩරු 4. කඩල

(70) මේදය අඩංගු ආහාරයකි,

1. ගොටුකොළ 2. බතල 3. නිවිති 4. කජු

(71) අතිරේක ආහාර වර්ගයක් නොවන්නේ,

1. බිස්කට් 2. කේක් 3. වඩ 4. බත්

(72) ආහාර වේල් අතර වැදගත් ම ආහාර වේල වන්නේ,

1. උදේ 2. දවල් 3. සවස 4. රාත්‍රී

(73) නරක් වූ විට රතු පැහැයක් ගන්නා දෙයකි,

1. පාන් 2. බත් 3. පොල් බෑය 4. යෝගට්

(74) වේලීමෙන් පසු අග්ගලා සෑදිය හැකි දෙයකි,

1. පාන් 2. කේක් 3. බත් 4. කුරහන්

(75) පොත්පත් පාවිච්චිය පිළිබඳව ඔබට ගුරුතුමිය නිතරම ප්‍රශංසා කරයි නම් ඔබ තුළ යහපුරුදු,

1. ඇත. 2. නැත. 3. කිව නොහැක.

(76) අපද්‍රව්‍ය පාරට දැමීම.

1. වරදකි. 2. වරදක් නොවේ. 3. සමහර වේලාවට වරදකි.

# සංජීව මාපා බණ්ඩාර

❖ පහත කතාව කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

එක දවසක් බල්ලෙක්, ගවයෙක් හා එළුවෙක් කුඹුරක් මැදින් ඇති නියරක ගමන් කළහ. සරුවට වැඩුණු ගොයම කරල් දුටු ගවයා කෙතට බැස ඒවා අනුභව කළේ ය. නැවතත් මේ යාළුවෝ තුන්දෙනා ගමන් ඇරඹූ හ. ටික දුරක් යන විට කොස් ගසක අත්තක් වැටී තිබෙනු දැක එළුවා අත්ත ළඟට ගොස් බඩ පිරෙන තුරු කොස් කොළ කෑවේ ය. බල්ලා පමණක් බඩගින්නේ මේ දෙන්නත් සමග ඉදිරියට ගියේ ය. මෙසේ යන විට මේ අයට මහන්සියක් දැනුණි. ඔවුන්ට නුග ගසක් හමු විය. ඔවුහු ගහමුල මහන්සියට ගිමන් ඇරිය හ. මේ ගහට භාරහාර ඔප්පු කරන්න මිනිස්සු එති. එදත් උදේ ගැහැනු ළමයි ආච්චිලා හා පැමිණ කිරිබත්, කේක්, රසකැවිලි ආදිය පූජා කර ගොස් තිබුණි. බල්ලාට එය ගත නොහැකිව ඉව අල්ලමින් බඩගින්නේ සිටියේ ය. මෙසේ සිටින විට පෙරේත කපුවෙක් පැමිණ පිඟාන පිටින්ම ගෙනයාමට කෑම පිඟාන ඔසවන විට පිඟාන පිටින්ම බිමට වැටුණි.
බල්ලා හිමින් සිරුවේ නැගිට ගොස් බඩ පිරෙන තුරුම මේ කෑම කෑවේ ය. දැන් යහළුවෝ තුන්දෙනාගේම බඩ පිරුණ නිසා තුන්දෙනාම සතුටින් නැවතත් ගමන් ඇරඹූ හ.

❖ ඉහත කතන්දරය ඇසුරින් වගුව පුරවන්න.

| පුද්ගල නාම | සත්ත්ව නාම | ස්ථාන නාම | ද්‍රව්‍ය නාම |
|---|---|---|---|
| 1. | 5. | 9. | 13. |
| 2 | 6. | 10 | 14. |
| 3. | 7 | 11. | 15. |
| 4. | 8. | 12. | 16. |

❖ කතන්දරයේ ඇති ඒක වචන, බහු වචන නාමපද වෙන් කර ලියන්න.

17. .................................. 18. .................................. 19. ..................................
20. .................................. 21. .................................. 22. ..................................
23. .................................. 24. .................................. 25. ..................................
26. .................................. 27. .................................. 28. ..................................
29. .................................. 30. .................................. 31. ..................................
32. ..................................

ඉහත කතන්දරයේ ඒක වචන හා බහු වචන ක්‍රියා පද වෙන් කරන්න.

33. .................................. 34. .................................. 35. ..................................
36. .................................. 37. .................................. 38. ..................................
39. .................................. 40. ..................................

❖ පහත දැක්වෙන අප්‍රාණවාචී නාම පද ප්‍රාණවාචී නාම පද වලට හරවන්න.

41. ජලාශ - ........................ 45. වෘක්ෂ - ........................ 48. පත්‍ර - ........................
42. ශාක - ........................ 46. පර්වත - ........................ 49. නදී - ........................
43. ප්‍රදීප - ........................ 47. මල් - ........................ 50. තාරකා - ........................
44. දිය දහර - ........................

❖ පහත දැක්වෙන වාක්‍ය වලට සුදුසු ක්‍රියා පදය යොදන්න ( වර්තමාන කාල )

51. පුෂ්පයෝ උයන අලංකාර ........................ 52. විහාරයෝ ගමට සෙත ........................
53. උද්‍යානයෝ කුරුලියෙන් අලංකාර ........................ 54. වලාවෝ අහසේ ගමන් ........................
55. කුරු ලතාවෝ සුළඟට ........................ 56. නෞකාවෝ මුහුදෙහි ........................
57. ගංගාවෝ මුහුදට ගලා ........................ 58. ශාක පත්‍ර යෝ සුළඟට ........................

❖ පහත ස්ත්‍රී ලිංග නාම පද වල පුරුෂ ලිංග නාම පද ලියන්න.

59. රජ කුමරිය - ......................

60. සෙබඩ - ......................

61. සෙර - ......................

62. සෙබළිය - ..............................

63. සේවිකාව - ......................

64. කෙනෙර - ......................

65. මැසින්න - ......................

66. වෙළඹ - ..............................

67. නිළිය - ..............................

68. ගෙවිලියග - ..............................

❖ සුදුසු අතීත කාල ක්‍රියා පදය යොදන්න.

69. ගොවියා කුඹුර ..............................

70. කුමරිය උයනට ..............................

71. ශිෂ්‍යයෝ අකුරු ..............................

72. වෛද්‍යවරු රෝගීන් පරීක්ෂා ......................

73. නිළියෝ රංගනයේ ..............................

❖ සුදුසු වර්තමාන කාල ක්‍රියාපදය යොදන්න.

74. තරුව අහසේ ..............................

75. පහන සුළඟට ..............................

76. අම්මා බත් ..............................

77. ගෙවිලිය සහල් ..............................

78. දේදුන්න අහසේ ..............................

❖ සුදුසු නපුංසක ලිංග නාම පදය ලියන්න.

79. ...................... විකසිත වෙයි.

80. ......................මුහුදට ගලා බසියි.

81. ...................... සුළඟට සෙළවෙයි.

82. ...................... පාරේ දුවයි.

83. ...................... හවසට බැස යයි.

❖ සුදුසු ප්‍රාණවාචී නාම පදය යොදන්න.

84. ...................... බෙහෙත් දුන්නා ය.

85. ...................... ගොයම් කැපූ හ.

86. ...................... මල් කැඩුවා ය.

87. ...................... ඉගිල ගියෝ ය.

88. ...................... මල් පැණි බීවේ ය

❖ පහත දැක්වෙන වාක්‍යවලට සුදුසු ක්‍රියාපද යොදන්න.

89. කුමරිය ඊයේ වනයට ..............................

90. වැද්දා කැලයට ..............................

91. සොරා අද රෑ ගෙය ..............................

92. මාමා හෙට ගමට ..............................

93. හංසයා විලේ ..............................

❖ පහත පද අයත් පුරුෂය නම් කරන්න.

94. නුඹ - ......................

95. තෝ - ......................

96. මම - ......................

97. ඔහු - ......................

98. ළමයා - ......................

❖ ලිඛිත බසට හරවා ලියන්න.

99. අපි ක්‍රීඩා කරනවා - ..............................................................

100. ඔහු ගමට යනවා - ..............................................................

101. මම කඩෙන් පොතක් ගත්තා - ..............................................................

102. තෝ ගමට ගියා - ..............................................................

103. තමුසෙලා බත් කෑවා - ..............................................................

104. නුඹලා සෙල්ලම් කළා - ..............................................................

105. තොපි අකුරු ලියනවා - ..............................................................

❖ පහත සඳහන් වැකිවලට සුදුසු සර්ව නාම පද හා ක්‍රියා පද යොදන්න.

106. ........................ කැමට ගියෙමු.

107. ........................ පොතක් ගත්තෙමි.

108. ........................ ගමනක් ගියෙහි ?

109. ........................ දර පැලුවෙහි ?

110. ........................ විභාගය සමත් වුවහෙයි ද?

111. ........................ හමන්නෙහු

112. ගෙතෙම ගමට ..............................................

113. තොපි ඇත්ත ..............................................

114. ඌ මියන් ..............................................

115. තුඹ පාසල් ..............................................

❖ පහත උක්ත පදය සඳහා ගැළපෙන අනුයුක්ත පදය ලියන්න.

116. මම - ..............................

117. අපි - ..............................

118. තෝ -..............................

119. තෙපි -..............................

120. ගැහැණියක්- ..................

121. ඔවුහු- ........................

122. බළල්ලු- ....................

123. මිනිස්සු -........................

124. මිනිසෙක් - ........................

125. ඉවදෙනක්-........................

❖ පහත අනුයුක්ත පදය යටින් ඉරක් අදින්න.

126. මම තා දිවීමි.

127. ගුරුතුමා සිසුන් කැඳවයි.

128. ගොපල්ලා හරකුන් එළවයි.

129. නංගී සමනලයින් අල්ලයි

130. පූසා මියන් අල්ලයි.

131. අම්මා මා නළවයි.

132. මිනිසා ගිරවුන් අල්ලයි.

133. බල්ලා සොරුන් ලුහු බදියි.

134. වැද්දා මුවන් මරයි.

135. ළමයා කුරුල්ලන් අල්ලයි.

❖ පහත සඳහන් වැකි වලට සුදුසු අනුයුක්ත පදය ලියන්න.

136. ගොපල්ලා ........................ රැකබලා ගනියි.

137. සිංහයා ........................ මරයි.

138. අපි ........................ දුටුවෙමු.

139. ඔහු ........................ දිවිය.

140. ඔහු ........................ දුටුවේ ය.

❖ පහත වාක්‍යවල විශේෂණ පදය යටින් ඉරක් අදින්න.

141. කුඩා ළමයා ඉදුණු අඹ කයි.

142. අක්කා පොඩි මල්ලිට කතා කළා ය.

143. මී මැස්සා මල් පැණි බොයි.

144. සොරු සහ කැලෑව පිරූහ.

145. ළමයා සුදු මල් දුටුවේ ය.

❖ පහත වාක්‍යයන්ට සුදුසු පද වරහන් තුලින් තෝරා ලියන්න.

( රළ වැළ, ලෙළ දේ, සඟ ගණ, රුක් පෙළ, පියාඹති, යති, සැරිසරති, මුවරළ, සෙවන දේ, වටු කැළ )

146. ගව රැළ වනයේ ........................

147. ........................ තණ බුදිති.

148. කොඩි පෙළ සුළගට ........................

149. ........................ වෙරළේ හැපේ.

150. බමර කැළ මලින් මලට ........................

151. ........................ වනය අලංකාර කරති.

152. ........................ අහසේ පියාසර කරති.

153. ........................ දනාව වැඩම කරති.

154. වවුල් කැළ පලතුරු සොයා ........................

155. රුක් පෙළ නගරයට ........................

❖ සුදුසු ක්‍රියා පදය යොදන්න.

156. බුදු රජහු සියලු සතුන්ට එක සේ මෙත් ........................

157. අපේ පිඩු සිටාණෝ කහවණු දහසක් පුජා ........................

158. සිරිසඟබෝ නිරිඳු දුගියාට හිස දන් ........................

159. මිහිදු තෙරණුවෝ ලක්දිවට වැඩම ........................

60. මැණියෝ තම දරුවන් ........................

❖ ගැළපෙන ක්‍රියා පදය යටින් ඉරක් අදින්න.

161. ඇතමෙක් ගී ( ගයයි/ ගයති )

162. එක් අයෙක් අත්පොළසන් ( දුන්නේ ය/ දුන්හ )

163. කෙනෙක් රෝගියා ( බලයි / බලති )

164. අයෙක් නැටුම් ( නටයි/ නටති )

165. සමහරු වැඩ කරයි/ කරති )

❖ උක්තය බලා සුදුසු අතීත කාල ආඛ්‍යාත පද තෝරා යටින් ඉරක් අඳින්න.

166. මාමා අපගේ නිවසට ( එයි/ ආවා ය/ ආවේ ය. )

167. එළදෙන්නු පැටවුන්ට කිරි ( දුන්හ/දෙයි/දුන්නා ය.)

168. තෝ මගේ පොත ( ගත්තෙහි/ ගත්තහු/ ගත්හි: )

169. කුරුල්ලා කෑදලි කරා පියාසර ( කරයි/ කළේ ය./ කළහ. )

170. ඇ විනෝද චාරිකාවක් ( යයි/ ගියේ ය/ ගියා ය. )

❖ පහත වැකි බහු වචනයට හරවා ලියන්න.

171. ගොවියා කුඹුර වපුරයි - ..............................................................................

172. මම පොත කියවමි - ..............................................................................

173. තෝ ගස කපහි - ..............................................................................

174. ඔහු සමනලයා අල්ලයි - ..............................................................................

175. ගුරුවරයා ළමයාට උගන්වයි - ..............................................................................

❖ ක්‍රියා විශේෂණය යටින් ඉරක් අඳින්න.

176. කළු බල්ලා වේගයෙන් දුවයි.

177. සුදු නංගී හයියෙන් අඬයි.

178. දක්ෂ ශිෂ්‍යයාව පිළිවෙළින් ලියයි.

179. කරුණාවන්ත ගුරුතුමිය ආදරයෙන් කථා කරයි.

180. ලස්සන ගායිකාව මිහිරි ව ගයයි.

❖ පහත පුරුෂ ලිංග වැකි ස්ත්‍රී ලිංග වැකි බවට හරවා ලියන්න.

181. ගායකයා ගී ගැයුවේ ය. - ..............................................................................

182. ගුරුතුමා ළමයින්ට අකුරු කියා දුන්නේ ය. - ..............................................................................

183. පියවරු දරුවන් රකිති. - ..............................................................................

184.මල්ලී මිටර සියය තරගය දිව්වේ ය. -..............................................................................

185. මුවා දලු කොළ බුදිති.- ..............................................................................

❖ පහත වැකි ඕ/ හු ප්‍රත්‍යය යෙදීමෙන් බහු වචන බවට හරවා වැකි නැවත ලියන්න.

186. සැදෑ වලාව අහසේ පාවෙයි - ..............................................................................

187. තාරකාව දිලිසෙයි. - ..............................................................................

188. ගස සුළඟින් සැලෙයි - ..............................................................................

189. අහස් යානාව පියාසර කරයි - ..............................................................................

190. පර්වත ඈතින් දිස්වෙයි - ..............................................................................

❖ උචිත සර්වනාම පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

191. .................................... ගමනට සූදානම් වූවහි ද? ( නුඹ/ නුඹලා )

192. .................................... සත්‍යවාදදී මිනිසෙක් වෙයි. ( ඔහු / ඔවුහු )

193. .................................... මවුපියන්ට කීකරු වන්නෙමු. ( අප/ අපි )

194. .................................... හරි හුරතල් බලු පැටියෙකි. ( ඌ/ උන් )

195. .................................... ශිෂ්‍යත්ව විභාගයෙන් උසස් ලෙස ( මම/මා) සමත් වෙමි.

❖ පහත වැකි අතීත කාලයට හරවන්න.

196. මල්ලී බත් කයි. - ..............................................................................

197. නිළිය මනහර රැඟුම් පායි. - ..............................................................................

198. ලේඛිකාව පොත් ලියයි. - ..............................................................................

199. නාහිමියෝ විහාරයට වඩිති. - ..............................................................................

200. මාමා [illegible] - ..............................................................................